**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු එකතුව රු. 1,891,808 ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රු. 871,942 ක වියදමින් ඉදිකිරීම් නිමකර සභාවට භාර දී තිබූ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ ගබඩා කාමරයෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 1,027,679 ක් වූ හිඟ වාහන කුලී සම්බන්ධයෙන් ලේඛනය හා කාල විශ්ලේෂණයද, එකතුව රු.120,652 ක් වූ ක්ෂේත්‍ර තොග සම්බන්ධයෙන් තොග ලේඛනය හා උපලේඛනයද, හිටපු සභාපතිවරයාගේ රාජකාරි සඳහා යොදාගත් පුද්ගලික වාහනයට ගෙවන ලද එකතුව රු. 844,340 ක් වූ වියදම් සම්බන්ධයෙන් එක් එක් දිනයේදී කරන ලද රාජකාරි කටයුතු පිළිබඳ විස්තරද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.3. නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් රු. 186,400 ක් සභා අරමුදලින් වියදම් කර තිබුණි. |
| (ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 වන වගන්තිය | යොමුගත විධිවිධාන වලට අනුකූල නොවී සභාව විසින් සේවකයන් 5 දෙනෙකු බඳවාගෙන 2014 නොවැම්බර් 24 සිට 2015 ජුනි 08 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු. 322,445 ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,189,127 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 264,134 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,924,993 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කල රු. 29,133,511 ක මුළු පුනරාවර්තන ආදායමින් රු. 20,388,415 ක් අයකර තිබූ අතර ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 70 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු. 24,147,171 ක හිඟ ආදායමින් රු. 8,314,583 ක් වර්ෂය තුළදී අයකර තිබුණි. හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 34 ක් විය.

## 2.2.2 වරිපනම් බදු

හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ)වගන්තිය ප්‍රකාර කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් හා බදු ශේෂය රු. 1,156,379 ක් වී තිබුණි.

## 2.2.3 බදුකුලී

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 27 දිනැති, අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 01,02 හා 04 වන ඡේද අනුව, විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීම හා විධිමත් සහා සම්මතයක් අනුව බදුකරුවන් තෝරා ගැනීම, කඩ කාමර තක්සේරු කිරීම, එක්වන් මුදලක් ලබා ගැනීම, යන අවශ්‍යතාවයන් ඉටු නොකර, බණ්ඩරවත්ත පොදු වෙළඳපොලෙහි කඩ කාමර 20 ක් හා පුස්තකාල සායන ගොඩනැගිල්ලේ කඩ කාමර 25 ක් බදුදී තිබුණි.

(ආ) චක්‍රලේඛයේ ඡේද අංක 04 ට අනුකූල නොවී 2001 වර්ෂයේ සිට 2015 මාර්තු දක්වා කාලය තුළ බදු දී තිබුණු කඩකාමර 33 ක් වෙනුවෙන් එකතුව රු. 8,653,915 ක් වූ එක්වන් මුදල් අයකර ගැනීම 2015 දෙසැම්බර් 31 වන විටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

## 2.2.4 යන්ත්‍රෝපකරණ ආදායම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩරය, ලොරි බවුසරය හා ගලි බවුසරය කුලියට දීම වෙනුවෙන් ඉකුත් වර්ෂ සඳහා එකතුව රු.1,027,679 ක් සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එකතුව රු. 42,800 ක් අයවිය යුතුව තිබූ නමුත්, එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉහත (අ) ඡේදයෙහි සඳහන් ඉකුත් වර්ෂවලට අදාළ හිඟයෙන් එකතුව රු. 75,350 ක මුදලක් සභාවේ සේවයේ නියුතු අයගෙන් හා සභිකයින්ගෙන් අයවිය යුතුව පැවතුණි.

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 224,960 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 11,914,011 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

අවිධිමත් ගනුදෙනු

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය අනුව අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා නොගෙන 2014 අ.පො.ස. (සා.පෙළ) විභාගය ඉලක්ක කර පවත්වන ලද සම්මන්ත්‍රණයකට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම සඳහා රු. 94,670 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**4.1 අයවැය පාලනය**

---

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයන් 05 ක එකතුව රු.3,325,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනද, තවත් වැය විෂයයන් 05 ක එකතුව රු.80,528,736 ක් වූ ඉතිරි කිරීම්ද, සීමාව ඉක්මවන තවත් වියදම් විෂයයක රු.3,123,472ක වියදම්ද, ආදායම් විෂයයන් 02 ක ළඟා කර නොගත් රු.84,210,859 ක ඉලක්කයන්ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 වත්කම් කළමනාකරණය**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

සභාවේ කොහු මෝල ව්‍යාපෘතියෙහි නිෂ්පාදන කටයුතු 2014 පෙබරවාරි මාසයේ සිටද, කුට්ටි ගල් නිෂ්පාදන වැඩපලෙහි නිෂ්පාදන කටයුතු 2015 ජුනි මාසයේ සිටද, ක්‍රියාත්මක නොකිරීම නිසා එම ව්‍යාපෘති වලට අදාළ වත්කම් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බාහිර පාර්ශවයන්ට ලබා දී ඇති වත්කම්

---

ඉකුත් වර්ෂයේදී සභා අරමුදලින් රු. 1,048,600 ක් වැයකර ලැප්ටොප් පරිගණක 14 ක් මිලදී ගෙන සභාවේ සභිකයින් වෙත ලබා දී තිබූ අතර, සභාවේ හිටපු සභාපතිවරයා වෙත ලබා දී තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය 2016 අප්‍රේල් 11 දින දක්වා සභාවට නැවත භාරදී නොතිබුණි.

(ඇ) පවරා නොගත් වත්කම්

---

සභාව විසින් භාවිතා කරනු ලබන කැබ් රථ තුනක, ගලි බවුසරයක, මෝටර් ග්‍රේඩරයක, ට්‍රැක්ටරයක හා ට්‍රේලරයක, ලොරි බවුසරයක සහ අත් ට්‍රැක්ටරයක ලියාපදිංචි අයිතිය පවරාගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය